# 21 නුවණක්කාර හා පැටියා



එක් විශාල කැලෑවක අලි, කොටි, වලස් ආදි සත්තු ද මොනර, ගිරා, මලිති, කොවුල් ආදි පක්ෂීහු ද වාසය කළා. මේ කැලේ සතුන්ගෙ නායකයා සිංහයෙක්. කැලේ සත්තු සිංහයාට **බියෙන්** වාසය කළා. අනෙක් සතුන්ට වගේ සිංහයාට ද ගොදුරු සොයා ගැනීමට සිදු වුණා. දවසක් කපටි නරියකු සිංහයා හමුවීමට ආවා.

ගල්ගුහාවේ වැතිරී සිටින සිංහයා දුටු නරියා ඒ දෙසට **හෙමින් හෙමින්** ගියා. සිංහයාට සමීප වී මෙසේ කිව්වා.

" රජතුමනි, ඔබතුමා හැමදා ම ගොදුරු සොයා ඇවිදිනවා. ඒක ඔබට කරදරයක්. ඔබතුමාගේ ආහාර පිණිස සතකු බැගින් මෙහි ගෙන්වා ගැනීමට පිළිවෙළක් යොදගන්න. එවිට මහන්සි නොවී ගුහාවට වී සිටීමට පුළුවන්."

" හැබෑමයි ඒ අදහස හරි අගෙයි. ඒත් කොහොම ද සතුන් ගෙන්වා ගන්නේ?" සිංහයා ඇසුවා.

" ඒක හරි ම පහසු වැඩක් රජතුමනි, ඔබතුමා කැලේ සතුන්ගේ නායකයා නේ. සතුන්ට නියෝගයක් යවන්න, දවසට එක් සතකු බැගින් මෙහි එන ලෙස. "

සිංහයාගේ නියෝගය පරිදි දවසකට එක් සතකු බැගින් ගුහාවට ආවා. සිංහයා කා ඉතිරි වන දේ නරියා කෑවා.

එක දවසක් සිරිත් පරිදි නියමිත වේලාවට සතකු ආවේ නැහැ.

"මට කෑමට හැමදා ම සතකු ගේන්න ඕනෑ" සිංහයා නරියාට ගොරවමින් කිව්වා. එදා හා පැටියකුගේ දවස. හාවා **බයෙන් බයෙන්** සිංහයා සිටි ගුහාව ළඟට ළංවුණා.

"නුඹ ඉක්මනින් ආවේ නැත්තේ ඇයි? මම හරි ම **බඩගින්නෙන්** හිටියේ" සිංහයා **කෝපයෙන්** ගර්ජනා කළා. හාවා දෙකට තුනට නැමී වැඳගෙන මෙසේ කීවා. "රජතුමනි, අතරමග දී ඔබ වැනි සිංහයෙක් හමුවුණා. එතුමා **සැරෙන්** කිව්වා මේ කැලෑවේ නායකයා ඔහු බව. බිය වූ මම ප්‍රමාද වුණේ ඒ නිසා" හාවා **හෙමින්** කිව්වා.

සිංහයා **කේන්තියෙන්** කෑගැසුවා "මමයි නායකයා. යමු එහෙනම් එයා කවුද කියා බලන්න" සිංහයා හාවා සමග කැලෑවට පිටත් වුණා.

අතරමග දී ළිඳක් දකින්නට ලැබුණා. හාවා **බයෙන් බයෙන්** ළිඳ ළඟට කිට්ටු වුණා.

" රජතුමනි අර සිංහයා හිටියේ මේ ළිඳ ඇතුළේ. "කෝ බලන්න ඒ නායකයා" කියමින් සිංහයා ළිඳට එබුණා. ළිඳේ තමාගේ ඡායාව දැක සිංහයා රැවටුණා. සිංහයා **ගොරවමින්** ළිඳට පැන්නා. ඉන්පසු කැලේ සත්තු **සතුටින්** වාසය කළා.

## ක්‍රියාකාරකම : 1

මෙම පාඩම කියවන්න. එහි තද කළු අකුරු සහිත පද විමසා බලන්න. ඒ පිළිබඳ ව ගුරුතුමා/ගුරුතුමී සමග සාකච්ඡා කරන්න. ඒවා උපුටා ලියන්න.

## ක්‍රියාකාරකම : 2

පහත සඳහන් කොටුවේ එවැනි පද තිබේ දැයි බලන්න. ඒවා සොයා ලියන්න.

| | | |
|---|---|---|
| දුකෙන් | හමුවීම | වේගයෙන් |
| මෙසේ | කනගාටුවෙන් | ගාට ගාට |
| හරියට | සවසට | මෙපරිදි |
| සතුටෙන් | ඇවිදිමින් | හෙමින් |

## ක්‍රියාකාරකම : 3

මෙම වාක්‍යවල හිස්තැනට සුදුසු වචන, පහත කොටුවේ දී ඇති වචනවලින් තෝරා ලියන්න.

i. අපි ඔබ ________________ පිළිගන්නෙමු.

ii. අම්මා ________________ දරුවා නැළෙව්වා ය.

iii. සරෝජා විභාගය ________________ කළ බව කීවා ය.

iv. කම්කරුවෝ ________________ වැඩ කළහ.

v. නංගී චිත්‍රය ________________ පාට කළා ය.

vi. බස්රිය ________________ ඉදිරියට ගමන් කළේ ය.

vii. අම්මා ________________ කෑම හැදුවා ය.

viii. ළමයි ________________ ගෙවල්වලට ගියෝ ය.

ix. හෙදියෝ රෝගීන්ට ________________සාත්තු කළහ.

x. අශ්වයා________________ දුවයි.

| | | | |
|---|---|---|---|
| හොඳින් | ආදරයෙන් | රසට | |
| සාදරයෙන් | ලස්සනට | කරුණාවෙන් | හෙමින් හෙමින් |
| වේගයෙන් | ඉක්මනින් | කැමැත්තෙන් | |

## ක්‍රියාකාරකම : 4

පහත සඳහන් වාක්‍යවලට සුදුසු පද වරහනින් තෝරන්න.

උදා: ළමයා ( හොඳ / හොඳින් ) පාඩම් කරයි.

i. ළමයි ( උනන්දුව / උනන්දුවෙන් ) ඉගෙන ගනිති.

ii. දුම්රිය ( වේගයෙන් / වේගය ) ගමන් කරයි.

iii. මල්ලී ( තාලය / තාලයට ) ගී ගයයි.

iv. කුහුඹුවෝ ( කඩිසර ව / කඩිසර ) කෑම සොයා යති.

v. දෙමවුපියෝ දරුවන්ට ( කරුණාව / කරුණාවෙන් ) අවවාද කරති.

## ක්‍රියාකාරකම : 5

පහත සඳහන් වචන යොදා වාක්‍ය ලියන්න.

i. ඉක්මනින්
ii. දුකින්
iii. හැඩට
iv. සතුටින්
v. පිටතට
vi. කෝපයෙන්
vii. කඩිසර ලෙස
viii. කරුණාවෙන්
ix. හෙමින්
x. ආදරයෙන්

## ක්‍රියාකාරකම : 6

ඉහත ක්‍රියාකාරකමෙහි ඇති වචන වැනි වෙනත් වචන පහත කවි පන්තියෙන් සොයා ලියන්න.

i.
හෙමින් හෙමින් එබි එබී
මලින් මලට පය තියා
පොඩි දෙව් දූරියෝ රෑ මැද
හඳ එළියේ ඇවිදිති

ii.
සිඟිති තොලේ ගෑවිලා
උඩට නැගෙන මල් හිනා
දෝත දෝත ගෙන හෙමිහිට
පරෙස්සමෙන් පැනයති